# පුවත් හසුන

උක් පර්යේෂණ ආයතනය

වෙළුම 10 කාණ්ඩය 02

ජුනි 2021

# සෙවනගල සීනි කර්මාන්තය ආශ්‍රිත කාබනික පොහොර ව්‍යාපෘතිය ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණයට



රජයේ හරිත කෘෂිකාර්මික සංකල්පයට අනුගත වෙමින් මේ වනවිට සියලුම උක් කර්මාන්තශාලා ආශ්‍රිතව කාබනික පොහොර නිෂ්පාදනය වේගවත් කර ඇත. මෙහි තවත් එක් සාර්ථක සංධිස්ථානයක් සලකුණු කරමින්, ලංකා සීනි පුද්ගලික සමාගමේ සෙවනගල ඒකකය විසින් වාර්ෂික ධාරිතාව මෙට්‍රික් ටොන් 8,000ක කාබනික පොහොර සැකසුම් ඒකකයක් එම පරිශ්‍රය තුළ ඉදිකරන ලද අතර, එහි නිරීක්ෂණ චාරිකාවකට උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා එක් විය.

කාබනික පොහොර නිපදවීමේ නියමුවා වෙමින් 2017 වර්ෂයේ දී ගල්ඔය වැවිලි සමාගම විසින් මෙට්‍රික් ටොන් 8000ක වාර්ෂික ධාරිතාවයකින් යුක්ත පොහොර නිෂ්පාදනාගාරයක් ප්‍රථමයෙන්ම ආරම්භ කළ අතර, මේ වනවිට ලංකා සීනි පුද්ගලික සමාගමේ පැල්වත්ත ඒකකය ද කාබනික පොහොර නිෂ්පාදන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර ඇත.

## ඇතුලු පිටු


- උක් වගාවට බිංදු ජල සම්පාදන තාක්ෂණය හඳුන්වාදීම සඳහා පර්යේෂණ ඇරඹේ 02
- සීනි සංවර්ධන ප්‍රතිපත්තිය පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කෙරේ 02
- සීනි කර්මාන්ත ආශ්‍රිත කාබනික පොහොර නිෂ්පාදනය ඉහළට 03
- උක් පර්යේෂණ ආයතනයෙන් ලබා ගත හැකි විශ්ලේෂණ සේවාවන් 03
- කාබනික කෘෂිකර්මාන්තය තුළින් හරිත උක් කර්මාන්තයක් 04-05
- උක් පර්යේෂණ පාලක මණ්ඩලයට තවත් ප්‍රවීණයෙක් පත්වේ 06
- ජපානයේ යාන්ත්‍රිකරණ තාක්ෂණ ආචාර්ය උපාධියක් සමගින් තිලංක ආරියවංශ නැවතත් උක් පර්යේෂණ ආයනයේ සේවයට 06
- සීනි කර්මාන්තයේ නවකයාගෙන් නව සැලසුම් 07
- කොවිඩ්-19 වසංගතය හමුවේ ගෝලීය සීනි නිෂ්පාදනය 08


# සියයට 8ක වාර්තාගත සීනි උකහාගැනීමක් සමග ඇතිමලේ වැවිලි සමාගම නිෂ්පාදන කටයුතු අරඹයි




මේ වනවිට නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇති ඇතිමලේ වැවිලි (පුද්.) සමාගමේ සීනි නිෂ්පාදනය ඉතා සාර්ථකව සිදු කරගෙන යනු ලබන අතර, සාමාන්‍යයෙන් දෛනිකව උක් ටොන් 1,200ක පමණ ඇඹරුම් ධාරිතවකින් සීනි නිෂ්පාදනය කරයි. සීනි නිෂ්පාදනයට අමතරව, මෙමගින් මෙගා වොට් 04ක විදුලිය නිපදවන අතර, එය ජාතික විදුලිබල පද්ධතියට සපයනු ලැබේ. මේ වන විට ස්කාගාරයේ ඉදිකිරීම් කටයුතු ද වේගවත් කර ඇත.

7-8% ක දෛනික සීනි උකහාගැනීමේ ප්‍රතිශතයක් (Sugar Recovery Percentage) වාර්තා කරමින් සිනි නිෂ්පාදන ක්‍රියාවලිය පවත්වාගෙන යන අතර, ඉදිරි මාස කිහිපය තුළ දී මෙම අගය 8% සීමාව ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහි ඇති තවත් විශේෂත්වයක් වන්නේ සමාගම සතු වගාකළ භූමි ප්‍රමාණයෙන් 90%ක් පමණ උක් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශකර හඳුන්වා දෙන ලද එස්. එල්. 96 128 ප්‍රභේදය මගින් මෙම උකහාගැනීමේ ප්‍රතිශතය වාර්තා කර තිබීමයි.

# උක් වගාවට බිංදු ජල සම්පාදන තාක්ෂණය හඳුන්වාදීම සඳහා පර්යේෂණ ඇරඹේ

උක් වගාවේ දැනට බහුලව භාවිතාවන ඇලි දිගේ ජල සම්පාදන ක්‍රමය (මතුපිට ජල සම්පාදනය) වෙනුවට අවම වාරි ජල ප්‍රමාණයක් යොදා ගනිමින් කළ හැකි බිංදු ජල සම්පාදන ක්‍රමය හඳුන්වාදීම සඳහාවන මූලික පර්යේෂණ කටයුතු උක් පර්යේෂණ ආයතනය විසින් ආරම්භ කොට ඇත. ඔනේෂ් ඇග්‍රිකල්චර් පුද්ගලික සමාගමේ සහ ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකයේ මූල්‍යමය හා ශ්‍රම දායකත්වය මත මෙම පර්යේෂණය සිදු කෙරේ.

උප පෘෂ්ඨීය ක්‍රමයට (පස යටින්) ස්ථාපනය කොට ඇති නාල පද්ධතියක් මගින් බිංදු ජල සම්පාදනය සිදු කෙරෙන අතර, ඒක පේළි හා ද්වි පේළි යන ක්‍රම දෙක යටතේ මෙම තාක්ෂණය භාවිතා කළ හැකිය. මෙම ක්‍රමය තුළින් වාරි ජලය දළ වශයෙන් 34% කින් ඉතිරි කර ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරන අතර, අස්වනු වැඩිවීමක් ද බලාපොරොත්තු වේ. පොහොර ජලයේ දියකර කෙලින්ම උක් ශාකයේ මූල කලාපයට ලබා දීමට ද මෙම නව ක්‍රමයට හැකියාව පවතින නිසා පොහොර අපතේ යාම අවම කරගත හැකි අතර, පොහොර යෙදීම සඳහාවන ශ්‍රම වියදම ද ඉතිරි කර ගත හැකිය.


උප පෘෂ්ඨීය ක්‍රමයට ජලය සපයන පර්යේෂණ වගාව - සෙවනගල


පොලිතීන් පොකුණු ක්ෂේත්‍ර ආදර්ශනය සෙවනගල

වර්ෂාපෝෂිත වගාවන් සඳහා විශේෂයෙන් වැදගත්වන වැසි ජලය එකතු කර ගත හැකි පොලිතීන් පොකුණු ක්‍රමය ද මේ යටතේ අත්හදා බැලීමට ඉදිරියේ දී බලාපොරොත්තුවන අතර, දැනට ඩීසල් බලයෙන් ක්‍රියාකරන ජල පොම්පයක් භාවිතාකොට ජල සම්පාදනය කෙරේ. ඉදිරියේ දී සූර්ය බල තාක්ෂණයෙන් ක්‍රියා කරනු ලබන ජල පොම්ප මේ සඳහා භාවිතයට ඇති හැකියාව ද අධ්‍යනය කිරීමට අදාළ පර්යේෂකයින් බලාපොරොත්තු වේ.

පර්යේෂණයේ අවසන් වාර්තාව ලබන වසරේ (2022) ජූලි මාසය වන විට නිකුත් කිරීමට සැලසුම්කොට ඇති අතර, එහිදී මෙම ක්‍රමයේ ආර්ථික වාසි හා අවාසි ගැඹුරින් සාකච්ඡා කිරීමට පර්යේෂකයින් බලාපොරොත්තු වේ. පර්යේෂණයේ ප්‍රතිඵල මත ඉදිරියේ දී නියමු ව්‍යාපෘතියක් ලෙස වර්ෂා පෝෂිත උක් වගාව සඳහා මූලිකවම මෙම තාක්ෂණය හඳුන්වාදීමට උක් පර්යේෂණ ආයතනය අපේක්ෂා කරයි. (lmjrw@yahoo.com)

# සීනි සංවර්ධන ප්‍රතිපත්තිය පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කෙරේ

රජයේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, රටේ සීනි අවශ්‍යතාව දේශියව සපුරාගත යුතුය යන්න දක්වා ඇත. ඒ අනුව යමින්, ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්ත සංවර්ධනය සඳහා එය නිසි ලෙස සැලසුම් කිර්ම, මග පෙන්වීම හා නියාමනය සඳහා ප්‍රතිපත්ති මාලාවක් සකස්කර එය ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ, ගරු රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර හා සීනි කර්මාන්තයේ ප්‍රධාන පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කිරීම 2021.03.12 දින උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරුඹුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ දී සිදු විය.


ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී දිනේෂ් කොඩිතුවක්කු මහතා ප්‍රතිපත්ති මාලාව ඉදිරිපත් කිරීම



එම ප්‍රතිපත්ති මාලාව සකස් කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යංශය, උක් පර්යේෂණ ආයතනය, ලංකා සීනි සමාගම හා ගල්ඔය වැවිලි සමාගම්වල ප්‍රධාන නිලධාරීන්ගේ දායකත්වය ලබාදුන් අතර, එය කෙටුම්පත් කරන ලද්දේ උක් පර්යේෂණ ආයතනය විසිනි. මෙම කෙටුම්පත උක් පර්යේෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී දිනේෂ් කොඩිතුවක්කු මහතා විසින් අදාළ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරන ලද අතර, එය ඉදිරියේ දී අවශ්‍ය සංශෝධන සහිතව රේඛීය අමාත්‍යාංශය මගින් කැබිනට් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. (puwathhasunasri@gmail.com)

බොහෝ සීනි කර්මාන්තශාලාවල අතුරු නිෂ්පාදනයක් ලෙස කාබනික පොහොර නිපදවනු ලබයි. නමුත් ශ්‍රී ලංකාවේ සෙවනගල, පැල්වත්ත, ගල්ඔය හා ඇතිමලේ කර්මාන්තශාලා හතරෙන්ම 2020 වසර වනවිට කාබනික පොහොර නිෂ්පාදනය සිදු කරන ලද්දේ ගල්ඔය සීනි සමාගම පමණි. එහෙත් රජයේ නව හරිත සංකල්පය අනුව යමින් මේ වනවිට සියලුම සීනි කර්මාන්තශාලා කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමු වී ඇත. එමගින් වාර්ෂිකව කාබනික පොහොර මෙට්‍රික් ටොන් 30,000ක් පමණ නිපදවීමට අපේක්ෂා කෙරේ.

# සීනි කර්මාන්ත ආශ්‍රිත කාබනික පොහොර නිෂ්පාදනය ඉහළට


ලංකා සීනි පුද්ගලික සමාගමේ පැල්වත්ත ඒකකයෙහි කාබනික පොහොර නිෂ්පාදනය

ලංකා සීනි පුද්ගලික සමාගම (සෙවනගල, පැල්වත්ත) වර්තමානයේ කාබනික පොහොර නිපදවනු ලබන්නේ ඉවතලන පෙරහන් මඩ සමග විනෑස් මිශ්‍ර කිරීමෙනි. නමුත් ඉදිරියේ දී නව තාක්ෂණය යොදා ගනිමින් ප්‍රමිතියෙන් උසස් ජෛව කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා පොහොර කර්මාන්තශාලා 02ක් පැල්වත්ත සහ සෙවනගල ඒකකයන් තුළ පිහිටුවීමට සැලසුම් මේ වනවිට සකස්කර ඇත. එමගින් සියලුම උක් වගා භූමි සඳහා මෙම ජෛව කාබනික පොහොර භාවිතයට ගැනීමට නියමිතය.

ගල්ඔය වැවිලි සමාගමේ කාබනික පොහොර නිෂ්පාදනය හා බෙදාහැරීම








ගල්ඔය වැවිලි සමාගම විසින් සීනි නිෂ්පාදනයේ අතුරුඵලයන් වන පෙරහන් මඩ, බැගෑස් දහනයෙන් පසු ඉතිරිවන අළු හා එතනෝල් නිෂ්පාදනය අවසානයේ දී ඉතිරිවන විනෑස් භාවිතා කරමින් හා නව තාක්ෂණය යොදා ගනිමින් මෙම කාබනික පොහොර නියමිත ප්‍රමිතියකින් යුතුව නිෂ්පාදනය කරනු ලැබේ. එමෙන්ම පරිසර හිතකාමී ලෙස කාබනික පොහොර නිෂ්පාදන වැඩපිළිවෙල පවත්වාගෙන යනු ලබන අතර, එමගින් උක් කර්මාන්තශාලාවෙන් ඉවතලන සියලුම අතුරුඵල හා අපද්‍රව්‍ය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරමින් හා ඒවා මගින් ඇතිකරන පාරිසරික ගැටලුවලට තිරසාර විසඳුම් ලබා දීමට ද මෙම ව්‍යාපෘතියට හැකිවී ඇත.

මීට අමතරව, උක් ගොවීන් සඳහා හෙක්ටයාරයකට ටොන් 02ක් බැගින් කාබනික පොහොර ලබාදීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කර ඇති අතර, එහි දී නිෂ්පාදන පිරිවැය පමණක් අයකර ගනිමින් උක් ගොවීන්ගේ වගාව තුළටම පොහොර ප්‍රවාහනය කර දීම ද සිදු කරනු ලබයි.

# උක් පර්යේෂණ ආයතනයෙන් ලබාගත හැකි විශ්ලේෂණ සේවාවන්

සීනි කර්මාන්තශාලා, උක් වගාකරුවන්, ක්ෂේත්‍රයෙහි නියැලී සිටින පර්යේෂකයින්, විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් ඇතුළු බාහිර පාර්ශ්වයන්ගේ විශ්ලේෂණ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින්, උක් පර්යේෂණ ආයතනයේ බෝග පෝෂණ අංශය පහත සඳහන් විශ්ලේෂණ සේවාවන් ආරම්භ කර ඇති අතර, මේ සම්බන්ධ වැඩි විස්තර

අංශ ප්‍රධානී, බෝග පෝෂණ අංශය, උක් පර්යේෂණ ආයතනය ඇමතීමෙන් ලබා ගත හැකිය.
දුරකතන අංකය - 047 493 73 05
විද්‍යුත් ලිපිනය - asiriwee@gmail.com

උක් පර්යේෂණ ආයතනයේ සිට නියැදි ලබාගන්නා ස්ථානයට ඇති දුර අනුව ඉහත අයකිරීම් සුලු වශයෙන් වෙනස් වෙනස් විය හැකිය

| පරීක්ෂණය | එක් නියැදි පරීක්ෂණයක් සඳහා ගාස්තුව (රු) | | | | |
|---|---|---|---|---|---|
| | පස් | පත්‍ර | අකාබනික පොහොර | කාබනික පොහොර | ජලය |
| පී එච් අගය | 200.00 | - | - | 200.00 | 200.00 |
| විද්‍යුත් සන්නායකතාවය | 230.00 | - | - | 230.00 | 230.00 |
| කාබන් | 570.00 | 610.00 | - | 570.00 | - |
| නයිට්‍රජන් | 640.00 | 650.00 | 460.00 | 640.00 | - |
| පොස්පරස් | 520.00 | 650.00 | 540.00 | 520.00 | - |
| පොටෑසියම් | 740.00 | 800.00 | 600.00 | 740.00 | 700.00 |
| සෝඩියම් | 740.00 | 810.00 | 600.00 | 740.00 | 700.00 |
| මැග්නීසියම් | 780.00 | 850.00 | 670.00 | 780.00 | 780.00 |
| කැල්සියම් | 780.00 | 850.00 | 670.00 | 780.00 | 780.00 |
| පොටෑසියම්, සෝඩියම්, මැග්නීසියම්, කැල්සියම් | 2000.00 | - | - | 2000.00 | 2000.00 |
| නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් | - | 1500.00 | 1500.00 | - | - |
| සල්ෆර් | 900.00 | 1210.00 | 900.00 | 900.00 | - |
| සින්ක් | 900.00 | 850.00 | 900.00 | 900.00 | - |
| මැංගනීස් | 900.00 | 850.00 | 900.00 | 900.00 | - |
| කොපර් | 850.00 | 800.00 | 850.00 | 850.00 | - |
| අයන් | 850.00 | 800.00 | 850.00 | 850.00 | - |
| බෝරෝන් | 1000.00 | 1100.00 | 1000.00 | 1000.00 | - |
| සින්ක්, මැංගනීස්, කොපර්, බොරෝන් | 2000.00 | 2000.00 | 2000.00 | 2000.00 | - |
| ඊයම් | 1150.00 | 1360.00 | - | 1360.00 | - |
| කැඩ්මියම් | 1150.00 | 1360.00 | - | 1360.00 | - |
| ක්‍රෝමියම් | 1150.00 | 1360.00 | - | 1360.00 | - |
| නිකල් | 1150.00 | 1360.00 | - | 1360.00 | - |
| කැටායන හුවමාරු ධාරිතාවය | 2500.00 | - | - | 2500.00 | - |
| වයනය | 320.00 | - | - | - | - |
| තෙතමනය | 170.00 | - | - | 170.00 | - |
| ද්‍රාශ්‍ය ඝනත්වය | 120.00 | - | - | - | - |
| Particle Size Fractioition | 350.00 | - | - | - | - |

# කාබනික කෘෂිකර්මාන්තය තුළින් හරිත උක් කර්මාන්තයක්

## උක් පර්යේෂණ ආයතනය පර්යේෂණ වැඩසටහන් දියත් කරයි



රජය විසින් හඳුන්වා දී ඇති හරිත වගා සංකල්පයට අනුව කාබනික පොහොර භාවිතය පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. හරිත විප්ලවයත් සමග වැඩි යෙදවුම් හා වැඩි නිමැවුම් කෘෂිකර්මාන්තය මුළු ලෝකය පුරා දශක ගණනාවක සිට වර්ධනය වෙමින් පවතින අතර, එමගින් පරිසරයට හා මිනිසාට බලපෑමක් සිදුවෙමින් පවතින බවට විවිධ මත ඉදිරිපත් වෙමින් පවතී.

මේ නිසා මුළු ලොව පුරාම තිරසාර කෘෂිකර්මාන්ත සංවර්ධනයක් සඳහා යොමු වීමේ දී අති නිරවද්‍ය කෘෂි තාක්‍ෂණය (Precision Agriculture) හා කාබනික කෘෂිකර්මාන්තය වෙත නැඹුරු වෙමින් පවතී.

නමුත් කාබනික කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පර්යේෂණ වාර්තා අතලොස්සක් පැවතීම නිසා ඒ පිළිබඳ ඉදිරි සැලසුම් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රමාණික දැනුමක් නොමැතිකම හේතුවෙන් ඒ සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවී ඇත.

**උක් පර්යේෂණ ආයතනය විසින් හරිත කෘෂිකර්මාන්තය පිළිබඳ නවතම පර්යේෂණ ක්‍රියාදාමයක් දියත් කිරීමට සැලසුම්කර ඇත. එම පර්යේෂණ වැඩසටහන මෙහි දක්වා ඇත.**



| අකාබනික (දැනට පවතින ක්‍රමවේදය) | කාබනික |
|---|---|
| බිම් සැකැස්ම ✓ | බිම් සැකැස්ම ✗ |
| සුදුසු උක් ප්‍රභේද ✓ | සුදුසු උක් ප්‍රභේද ✗ |
| ජාන ප්ලාස්ම ✓ | ජාන ප්ලාස්ම ✗ |
| බීජ සිටුවීමේ ක්‍රම ✓ | බීජ සිටුවීමේ ක්‍රම ✗ |
| ජල සම්පාදනය ✓ | ජල සම්පාදනය ✗ |
| පොහොර යෙදීම | පොහොර යෙදීම |
| ප්‍රමාණය ✓ | ප්‍රමාණය ✗ |
| යොදන ආකාරය ✓ | යොදන ආකාරය ✗ |
| අනුපාතය ✓ | අනුපාතය ✗ |
| කාලය ✓ | කාලය ✗ |
| සංයුතිය ✓ | සංයුතිය ✗ |
| ලබා ගත හැකි බව ✓ | ලබා ගත හැකි බව ✗ |
| ඛණිජකරණය ✓ | ඛණිජකරණය ✗ |
| නිෂ්පාදන යෙදවුම් ✓ | නිෂ්පාදන යෙදවුම් ✗ |
| ශාක ප්‍රතිචාරය ✓ | ශාක ප්‍රතිචාරය ✗ |
| ප්‍රමිතිය ✓ | ප්‍රමිතිය ✗ |
| වල් මර්දනය ✓ | වල් මර්දනය ✗ |
| පාංශු සහ දේශගුණික සම්බන්ධතා ✓ | පාංශු සහ දේශගුණික සම්බන්ධතා ✗ |
| රෝග කාරක ✓ | රෝග කාරක ✗ |
| පළිබෝධකයින් ✓ | පළිබෝධකයින් ✗ |
| යාන්ත්‍රික අස්වනු නෙළීම ✓ | යාන්ත්‍රික අස්වනු නෙළීම ✗ |
| ආර්ථිකය ✓ | ආර්ථිකය ✗ |

දැනුවත් ✓
නොදැනුවත් ✗

අකාබනික පොහොර | කාබනික පොහොර

CI - බෝග වැඩිදියුණු කිරීමේ අංශය
CN - බෝග පෝෂණ අංශය
CP - බෝග ආරක්‍ෂණ අංශය
CRM - බෝග හා සම්පත් කළමනාකරණ අංශය
PT - සැකසුම් තාක්‍ෂණ අංශය
MT - යාන්ත්‍රිකරණ තාක්‍ෂණ අංශය
EBIT - ආර්ථික විද්‍යා, ජෛවමිතික හා තොරතුරු තාක්‍ෂණ අංශය
TTD - තාක්‍ෂණ හුවමාරු හා සංවර්ධන අංශය

### ශාක පෝෂණය නංවාලීමේ වැඩ සටහන (CN/CRM)

1. උක් වගාව හා සම්බන්ධ සියලු කාබනික පොහොර පිළිබඳ පර්යේෂණ සමාලෝචනය
2. උඩවලව සහ වෙනත් ප්‍රදේශවල කාබනික පොහොර පිළිබඳ ඇගයීමේ පරීක්ෂණ පැවැත්වීම
3. ආනයනික ඝන සහ ද්‍රව නයිට්‍රජන් පොහොර පරීක්ෂාව සහ ප්‍රමිතීන් සකස් කිරීම
4. ජෛවීය අඟුරු සැකසීම හා භාවිතය
5. උක් පර්යේෂණ ආයතනය විසින් හඳුනාගත් ආමුකූලක භාවිතයෙන් කාබනික පොහොර සැකසීම සඳහා අවශ්‍ය සහය සීනි කර්මාන්තකරුවන් හට ලබා දීම
6. උක් වගා බිම්වල කාබන් චක්‍රය සහතික කිරීම
7. අතුරු බෝග වගාව, පුරන් කළමනාකරණය, ග්ලිරිසීඩියා වගාව සහ ඇතුරුම් භාවිතය

### පාංශු ක්‍ෂුද්‍ර ජීවීන් වැඩි කිරීමේ වැඩ සටහන (PT/CN/CP/CRM)

1. දැනටමත් කාබනික ලෙස උක් වගාකර ඇති ප්‍රදේශවල පසෙහි පවතින ක්‍ෂුද්‍ර ජීවී විවිධත්වය හඳුනා ගැනීම
2. ක්‍ෂුද්‍ර ජීවී මාදිළි හඳුනාගැනීම සහ වෙන්කර ගැනීම
3. ආමුකූලක යෙදවුම් සකස් කිරීම
4. ආමුකූලක ක්‍රමවත්ව සැකසීම සහ ගබඩා කිරීම
5. ප්‍රයෝජනවත් ක්‍ෂුද්‍ර ජීවීන්ගේ මහා පරිමාණ රෝපණයන් ස්ථාපිත කිරීම සහ විවිධ පාංශු සහ දේශගුණික තත්වවල පැවැත්ම අධ්‍යනය
6. ක්‍ෂුද්‍ර ජීවීන්, වසුන් යෙදීම් සහ ජෛවීය අඟුරු භාවිතයෙන් පසේ පෝෂණය, තෙතමනය රඳවා තැබීම මගින් ඉතා හොඳ ශාක වර්ධනයක් අත්පත් කරගැනීමට අවශ්‍යවන ශෂ්‍ය විද්‍යාත්මක අධ්‍යනයන් සිදුකිරීම
7. කාබනික පොහොර යෙදූ පසෙහි ව්‍යාධිජනකයන්ගේ හැසිරීම අධ්‍යනය සහ පාලනය

### යාන්ත්‍රිකරණ තාක්‍ෂණ වැඩ සටහන (MT)

1. කාබනික පොහොර යොදවන යන්ත්‍ර
2. CN සහ CRM අංශවල නිර්දේශයන්ට අනුව පාංශු ක්‍ෂුද්‍ර ජීවී ක්‍රියා වැඩි කළ හැකි යන්ත්‍ර නිර්මාණය, නිපදවීම හෝ හඳුන්වාදීම සිදුකිරීම
3. CRM අංශයේ නිර්දේශයන් ට අනුව විවිධ ආකාරයන්ට බීජ සිටුවිය හැකි යන්ත්‍ර නිර්මාණය නිපදවීම හෝ හඳුන්වාදීම සිදුකිරීම
4. උක් අස්වනු නෙළීමෙන් පසු ඉතිරිවන උක් අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකි යන්ත්‍රයක් නිපදවීම
5. ප්‍රශස්ත ආකාරයට උක් අස්වනු නෙළීමට බාධාවන ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් සෙවීම

### ජල කළමනාකරණ වැඩ සටහන (CRM)

1. පාංශු තෙතමනය සංරක්‍ෂණය, පසට ජලය ඇතුළු වීම හා පසේ ජලය රඳවා ගැනීම වැඩි කිරීම

### ප්‍රභේද හඳුන්වාදීමේ වැඩ සටහන (CI)

1. අකාබනික පොහොරවලින් තොරව ජාන ප්ලාස්මය සංරක්‍ෂණය
2. කාබනික පොහොරවලට ගැළපෙන උක් ප්‍රභේද පරීක්ෂා කිරීම

EBIT
TTD

# උක් පර්යේෂණ පාලක මණ්ඩලයට තවත් ප්‍රවීණයෙක් පත්වේ



ආචාර්ය ඩබ්ලිව්. පී සෝමරත්න

උක් පර්යේෂණ ආයතනයේ පාලක මණ්ඩල අධ්‍යක්ෂවරයෙකු ලෙස ආචාර්ය ඩබ්ලිව්. පී සෝමරත්න 2021 මැයි මාසයේ සිට එක් විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථයකු වන ආචාර්ය සෝමරත්න 1980 වර්ෂයේ දී ආර්ථික විද්‍යා විෂයෙන් ප්‍රථම පංතියේ සාමාර්ථයක් සහිතව ගෞරව උපාධිය හිමිකරගෙන ඇති අතර, 1986 වර්ෂයේ දී එක්සත් රාජධානියේ ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියත්, 1998 වර්ෂයේ දී ඕස්ට්‍රේලියාවේ ලා ට්‍රෝබ් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියත් හිමිකර ගෙන ඇත.

අනතුරුව විවිධ ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ තම දැනුම ලබා දීමට කටයුතු කර ඇති අතර, විශේෂයෙන් කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘති සහ පර්යේෂණ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ වසර 39 අධික සේවා පළපුරුද්දක් ඔහු සතුව ඇත. මෙම සේවා කාලය තුළ දේශිය මෙන්ම විදේශිය විවිධ ව්‍යාපෘති සඳහා ඔහුගේ දායකත්වය ලබා දී ඇත. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද කෘෂි-කාර්මික සංවර්ධනය, කෘෂි - අගයදාම ප්‍රවර්ධනය, ප්‍රජා මූලික ජීවනෝපාය සංවර්ධනය, ප්‍රජා මූලික ජල කළමනාකරණය, දරිද්‍රතාවය පිටුදැකීම, කෘෂි පාරිසරික කළමනාකරණය, ප්‍රජාව හා පාර්ශවකරුවන් පුහුණු කිරීම වැනි ව්‍යාපෘති හා වැඩසටහන් කළමනාකරණය හා අධීක්ෂණය ඒ අතර ප්‍රමුඛ වේ.

විවිධ තනතුරු දරමින් ආයතන ගණනාවකම සේවය කර ඇති ඔහු, කුඩා වතු හිමියන්ගේ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, ලෝක බැංකුවේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ, නිපුණතා අංශ සංවර්ධන වැඩසටහනේ වැඩසටහන් ප්‍රතිසංස්කරණ විශේෂඥ, වතු සංවර්ධන ව්‍යාපෘතියේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥ, ඔක්ස්ෆෑම් - ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා කාර්යාලයේ වැඩසටහන් ප්‍රතිපත්ති සහ උපදේශක කළමනාකරු, පාකිස්තානයේ සාර්ක් මානව හිමිකම් සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ සාමාජික හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශයේ ප්‍රධානියා වැනි තනතුරු ගණනාවක් ඔහු විසින් හොබවා ඇත.

විවිධ අංශ ඔස්සේ ලබාගෙන ඇති විශේෂඥ දැනුම භාවිතා කරමින්, පාලක මණ්ඩල අධ්‍යක්ෂවරයෙක් ලෙස උක් පර්යේෂණ ආයතනයට වැඩිදුරටත් සේවාව ලබාදීමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි පතන්නෙමු.

(puwathhasunasri@gmail.com)

# ජපානයේ යාන්ත්‍රිකරණ තාක්‍ෂණ ආචාර්ය උපාධියක් සමගින් තිලංක ආරියවංශ නැවතත් උක් පර්යේෂණ ආයතනයේ සේවයට

තිලංක ආරියවංශ මහතා සිය ආචාර්ය උපාධිය 2021 මාර්තු මස අවසන්කර 2021 අප්‍රේල් මාසයේ දී නැවතත් උක් පර්යේෂණ ආයතනය හා සම්බන්ධ වන්නේ වසර පහකට පමණ පසුවය. එහි දී ශ්‍රී ලංකාවේ උක් පර්යේෂණ නව මාවතකට යොමු කරමින් ජෛව ක්‍රියාවලි සහ පද්ධති ඉංජිනේරු විද්‍යා විෂය පථය ඔහු විසින් දේශීය උක් කර්මාන්තයට හඳුන්වා දෙන ලදි.



ආචාර්ය තිලංක ආරියවංශ

ඒ මහතා උක් පර්යේෂණ ආයතනයේ යාන්ත්‍රිකරණ තාක්ෂණ අංශයෙහි සිය සේවාව ආරම්භ කරන්නේ 2012 වර්ෂයේදීය. එහි දී ඔහු උක් වගාවේ යාන්ත්‍රිකරණය පිළිබඳ විවිධ පර්යේෂණවල නිරත වූ අතර, 2016 වර්ෂයේ උක් පර්යේෂණ ආයතනයෙන් අධ්‍යන නිවාඩු ලබා ජපානයට පිටත් වන්නේ ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම සඳහාය.

ඔහු ජපානයේ ත්සුකුබා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සිදු කරන ලද කාලය තුළ ජෛව පද්ධති ඉංජිනේරු විෂය පථයට සම්බන්ධ විවිධ පර්යේෂණවල නිරත වූ අතර, එම පර්යේෂණ අතුරින් ත්සුකුබා විශ්වවිද්‍යාලයේ ඇල්ගී පෙට්‍රි ඉන්ධන නිපදවීම සහ ස්වයංක්‍රීය කෘෂි පද්ධති විශ්ලේෂණය වැනි පර්යේෂණ වැදගත් තැනක් ගනු ලබයි.

එමෙන්ම ඔහු තාක්ෂණික නිලධාරීවරයෙකු ලෙස ජපානයේ කාර්මික විද්‍යා සහ උසස් තාක්ෂණ පර්යේෂණ ආයතනයේ සේවය කළ අතර, එහි දී කර්මාන්ත IoT පද්ධති සැලසුම් සහ විශ්ලේෂණය කිරීම් සම්බන්ධ පර්යේෂණවල ද නිරත වී ඇත. මෙම කාලය තුළ ඔහු ලබාගන්නා ලද අත්දැකීම් මත පදනම්ව ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයට ගැලපෙන ආකාරයේ උක් වගාව යාන්ත්‍රිකරණය සම්බන්ධ නවතම පද්ධති සංකල්පයක් සහ විශ්ලේෂණයක් ඔහුගේ ආචාර්ය උපාධියේ අධ්‍යනය ලෙස සිදු කරන ලදි. එම පද්ධති සංකල්පය උක් සහ වියලි පත්‍ර නෙලීමේ තාක්ෂණය වන අතර, එය මේ වන විටත් පිළිගත් විද්‍යා සඟරාවල ද පළ කර ඇත. (puwathhasunasri@gmail.com)

# සීනි කර්මාන්තයේ නවකයාගෙන් නව සැලසුම්

ඇතිමලේ සීනි සමාගම නවීනතම පහසුකම් රැසකින් සමන්විත බැවින් මුළු කර්මාන්තශාලාවේම නිෂ්පාදන කටයුතු සේවකයන් 200කට අඩු සංඛ්‍යාවකින් පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත. එහි බොහෝ නිෂ්පාදන ක්‍රියාවලියන් ස්වයංක්‍රිය ලෙස සිදුවන බැවින් මෙලෙස සේවකයන් ප්‍රමාණය අඩුකර ගැනීමට හැකිවී ඇත.

මෙහි ඇති සුවිශේෂ අංගයක් ලෙස විද්‍යුත් ස්ථිතික පෙරණය (Electrostatic Precipitator Unit) හඳුන්වාදිය හැකිය. මෙමගින් බොයිලේරුවෙන් නිදහස්වන අළු අංශු (Fly Ash) බාහිර පරිසරයට විමෝචනය වීම මුළුමනින්ම නතර කරනු ලැබේ. තවද මෙහි ඇති අපජල පිරිපහදු පද්ධතිය මගින් කර්මාන්තශාලාවෙන් බැහැර කරන අපජලය කාර්මික හා ජෛව පිරිපහදු ක්‍රම මගින් පිරිසිදුකර, වෙනත් ස්ථානයක ඇති ටැංකිවල ගබඩාකොට එම ජලය නැවත සමාගම සතු උක් වගාවන් සඳහා ලබාදීම සිදු කරනු ලැබේ.

විද්‍යුත් ස්ථිතික පෙරණය
(Electrostatic Precipitator Unit)



මූලික සැලසුමට අනුව, වසරකට එතනෝල් ලීටර මිලියන 03ක් නිෂ්පාදනය කිරීමේ ධාරිතාවය සහිත ස්කාගාරයේ ඉදිකිරීම් කටයුතු ද මේ වනවිට ආරම්භ කර ඇත. එමගින් දිනකට එතනෝල් ලීටර් 18,500ක් පමණ නිපදවීමට හැකියාවක් ඇති අතර, එයටම සම්බන්ධ කරමින්, කාබන්ඩයොක්සයිඩ් වායු ජනන ඒකකයක් ද ඉදිකිරීමට සැලසුම් කර ඇත.



ඉදිකරමින් පවතින ස්කාගාරය

මීට අමතරව සීනි නිෂ්පාදනයේ අතුරුඵලයන්වන පෙරහන් මඩ සහ එතනෝල් නිෂ්පාදනය අවසානයේ දී ඉතිරිවන විනැස් භාවිතාකර කාබනික පොහොර නිෂ්පාදන ඒකකයක් ද ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, එහි කටයුතු නුදුරේදීම ආරම්භ කිරීමට නියමිතය. මෙම කර්මාන්තශාලාවේ ඇති තාක්‍ෂණයන් තුළින් වර්තමාන උක් කර්මාන්තශාලාවල පවතින ප්‍රධානම ගැටළු සඳහා පරිසර හිතකාමී තිරසාර විසඳුම් ලබාගැනීමට හැකි වී තිබීම විශේෂත්වයකි.




පෙරහන් මඩ අංගනය

2020 වර්ෂය ආරම්භයේ දී කර්මාන්තශාලාව සතුව හෙක්ටයාර 3,456ක වගා වපසරියක් පැවතුණි. එය ඉදිරි වසර කිහිපය තුළ දී හෙක්ටයාර 5,000 දක්වා වැඩි කිරීමටත්, එම වගා වපසරියෙන් 80%ක ප්‍රමාණයක්, උක් පර්යේෂණ ආයතනය මගින් හඳුන්වා දෙන ලද එස්.එල්. 96-128 ප්‍රභේදය පවත්වා ගැනීමටත් සැලසුම්කර ඇති බව එහි කළමනාකාරිත්වය පුවත් හසුන සමග පැවසීය.

(puwathhasunasri@gmail.com)

ඇතිමලේ ප්‍රදේශයේ උක් වගාවක්



# කොවිඩ්-19 වසංගතය හමුවේ ගෝලීය සීනි කර්මාන්තය




කොවිඩ්-19 වසංගතය හමුවේ වුවද 2020/21 අලෙවිකරණ වර්ෂය තුළ ගෝලීය සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 180ක් පමණ වූ අතර, එය අපේක්ෂිත නිෂ්පාදනයට වඩා මෙට්‍රික් ටොන් මිලියන 02ක අඩුවීමකි. ඒ සඳහා යුරෝපා සංගමයට අයත් රටවල මෙන්ම බ්‍රසීලයේ හා තායිලන්තයේ අපේක්ෂිත සීනි නිෂ්පාදනයේ අඩුවීම හේතු විය. එහෙත් එම නිෂ්පාදනය 2019/20 අලෙවිකරණ වර්ෂය හා සසඳන විට මෙට්‍රික් ටොන් මිලියන 14ක වැඩි වීමකි. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගත තත්වය ඉදිරියේ දී සමනය වේ යැයි උපකල්පනය කර හා ඉන්දියාවේ සීනි නිෂ්පාදනයේ ඉහළ යාමක් අපේක්ෂා කරමින්, 2021/22 වර්ෂය සඳහා ලෝක සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 186ක් වේ යැයි පුරෝකථනය කර ඇත.




2019/20 වර්ෂය තුළ දී ගෝලීය සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් මිලියන 170ක් හා 2020/21 වසර තුළ එය මෙට්‍රික් ටොන් මිලියන 171ක් විය. එසේම එම අගය 2021/22 වසර තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 174ක් දක්වා වැඩිවේ යැයි අපේක්ෂා කෙරේ.




ලෝක සීනි මිල 2021 මැයි මාසයේ දී වසර හතරකට පසු එහි වැඩිම අගය වාර්තා කරන ලදී. එහි දී ලන්ඩන් වෙළඳපොලේ සුදු සීනි සහ නිව්යෝර්ක් වෙළඳපොලේ පිරිපහදු නොකළ සීනි ටොන් 01ක සාමාන්‍ය මිල ඇමෙරිකන් ඩොලර් 461.8ක් විය. නමුත් 2020 වසරේ අප්‍රේල් මාසයේ දී එය ඇමෙරිකන් ඩොලර් 326ක තරම් අඩු අගයක පැවතුනි. 2020/21 වසර තුළ දී යුරෝපා සංගමයට අයත් රටවල සීනි නිෂ්පාදනයේ අඩුවීම, ලොව ප්‍රධාන සීනි අපනයනකරුවන් වන බ්‍රසීලයේ හා තායිලන්තයේ අපේක්ෂිත සීනි නිෂ්පාදනයේ අඩුවීම හා ලෝක වෙළඳපොලේ බොර තෙල් මිල ඉහළ මට්ටමක පැවතීම මෙම තත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

එසේම මෙම මිලෙහි අඩුවීමක් සිදුවීමට නම් ලොව ප්‍රධාන නිෂ්පාදකයන්ගේ නිෂ්පාදනයේ වැඩිවීමක් හා එය ලෝක වෙළඳපොලට පැමිණීමත් සිදුවිය යුතුය. එහෙත් කොවිඩ්-19 තත්වය, කාලගුණික බලපෑම් හා ඉහළ ඉන්ධන මිල හමුවේ එවැනි තත්වයන් කෙටි කාලීනව අපේක්ෂා කළ නොහැකිය.

(dinkodi@yahoo.co.uk)

උපදේශකත්වය
ආචාර්ය නිමල් කුමාරසිංහ - සභාපති
ආචාර්ය එම්. එස්. පෙරේරා - අධ්‍යක්ෂ/ප්‍ර. වි. නි. (වැ බ)

සංස්කාරක මණ්ඩලය
ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
කේ. ඒ. ඩී. කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන - පර්යේෂණ නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. ආර්. ප්‍රභාත් - සංවර්ධන නිලධාරී

පිටු සැකසුම හා නිර්මාණකරණය
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී

විමසීම්
අධ්‍යක්ෂ
උක් පර්යේෂණ ආයතනය
උඩවලව
දුරකථන: +472233281, +472233285
ෆැක්ස්: +472233233
ඊ මේල්: puwathhasunasri@gmail.com
වෙබ් අඩවිය: www.sugarres.lk

For Imfomation
Director
Sugarcane Research Institute
Uda Walawe
Telephone: +472233281, +472233285
Fax: +472233233
E-mail: puwathhasunasri@gmail.com
Web site: www.sugarres.lk

ප්‍රකාශනය
තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන අංශය - උක් පර්යේෂණ ආයතනය



ලිපි සහ තොරතුරු සැපයීමෙන් දායකත්වය
ඩී. පී. ඩබ්ලිව් පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
කේ. ඒ. ඩී. කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
ආචාර්ය තිලංක ආරියවංශ - පර්යේෂණ නිලධාරී
එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන - පර්යේෂණ නිලධාරී
ඒ. එන්. එම්. බී. ආර්. ප්‍රභාත් - සංවර්ධන නිලධාරී

උක් කර්මාන්තයට අදාළ ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබට දායක විය හැකි අතර, එම ලිපි ලේඛන හා ඔබගේ අදහස් හා යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක
පුවත් හසුන
උක් පර්යේෂණ ආයතනය, උඩවලව
ඊ මේල්: puwathhasunasri@gmail.com